## සාධාරණ සමාජයක් සඳහා මැතිවරණ සංශෝධන

**මැතිවරණ සංශෝධන සඳහා සංවාදයක් වෙනුවෙන්**

**සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය විසින් සම්පාදිතයි**

ඔක්තෝම්බර් 30, 2021

### සමාලෝචනය

පසු ගිය 2021 අප්‍රියෙල් මස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මැතිවරණ සංශෝධන සඳහා කාරක සභාවක් පිහිටුවීම සාධනීය පියවරකි. එවැනි කාරක සභාවක් මීට පෙර පත් කරන ලද්දේ 2003 දීය. එවකට එම සභාවේ සභාපති පදවිය දැරූ ගරු දිනේෂ් ගුණවර්ධන මහතා මෙම 2021 කාරක සභාවේත් සභාපති පදවිය දැරීම සුවිශේෂ වේ. 2003 කාරක සභා සභා අතුරු වාර්තාවේ සඳහන් වූ ලෙසට අනුව මැතිවරණ සංශෝධන තුලින් විශේෂයෙන්ම අරමුණු කෙරුනේ පහත සඳහන් ප්‍රශ්න වලට විසඳුම් සෙවීමය.

1. මැතිවරණ අපේක්ෂකයින් විසින් ප්‍රචණ්ඩ ක්‍රියා වල යෙදීම, ප්‍රමාණය ඉක්මවා වියදම් කිරීම හා රාජ්‍ය සම්පත් අයුතු ලෙස පරිහරණය කිරීම

2. තෝරා පත් කර ගන්නා නියෝජිතයන් හා ඡන්ද දායකයින් අතර දුරස්ථ බව

මෙම ප්‍රශ්න වලට ප්‍රධාන හේතුව වන්නේ පවතින මනාප ඡන්ද පදනම් කරගත් විවෘත ලැයිස්තු සමානුපාත ක්‍රමය (Open list proportional representation with preferential votes) තුල අපේක්ෂකයින්ට විශාල වපසරියක මනාප ඡන්ද සෙවීමේදී ඇතිවන අධි තරඟකාරීත්වය එහි අනිසි ප්‍රතිඵලයන්ය. විශේෂයෙන්ම එකම පක්ෂයේ අපේක්ෂයින් අතර තරඟකාරිත්වය උග්‍ර ප්‍රශ්නයක් වී ඇත.

විසඳුමක් ලෙසට මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයක් යොදාගත යුතු බවට සංවාදය 2003 වර්ෂය හෝ ඊට පෙර සිට පවතී. මිශ්‍ර මන්ත්‍රී ක්‍රමයේ අනිවාර්ය අංගයක් වන මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 60% ක් හෝ ආසන්න ගණනක් වඩා කොට්ඨාස මට්ටමෙන් කේවල ක්‍රමයට පත් කර ගැනීමේදී විසිරී සිටින සුළු ජන කොටස් වලට සුදුසු නියෝජිතයකු පත්කර ගැනීම් අවකාශය නැතිවන නිසා පවතින ක්‍රමය එලෙසම පවත්වා ගනිමින් මැතිවරණ සංස්කෘතිය වෙනස් කිරීම, පත්වන මන්ත්‍රීන්ට වගකිය යුතු ප්‍රදේශයක් භාර දීම හෝ පවතින සමානුපාත ක්‍රමයම වඩා කුඩා කොට්ඨාස වලින් පැවැත්වීම යන ක්‍රම වේද කෙරෙහිද අවධානය යොමු කර ඇත. ඒවා ගැනද යම් හැඳින්වීමක් මෙම ලේඛනයේ ඇමුණුමක සාකච්ඡාවට භාජනය කර ඇතත් මෙම සමාලෝචන ලේඛනය මූලිකවම මිශ්‍ර මන්ත්‍රී සමානුපාත මැතිවරණ ක්‍රමය වඩා සාධනීය ලෙස යොදා ගැනීම පිලිබඳවය.

සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය මගින් 2020 දෙසැම්බර් මස සිට පවත්වන ලද කතිකා මාලාව හා විවිධ පාර්ශව කරුවන් සමග පවත්වන ලද සාකච්ඡා තුලින් සාධාරණ මැතිවරණ ක්‍රමයක් සඳහා තීරණාත්මක සාධක රැසක් මූල ධර්ම හතරක් ඔස්සේ - එනම් (1) සාධනීය දේශපාලන සංස්කෘතියක් (2) ස්වාධීන හා පාරදෘශ්‍ය මැතිවරණ ක්‍රියාවලියක් (3) සාධාරණ නියෝජනයක් හා (4) හා පත්වන ආණ්ඩුවට යම් ස්ථාවරත්වයක්-- සංවිධානය කර ඉදිරිපත් කිරීම මෙම ලේඛනයේ අරමුණයි.

> පළාත් පාලන හා පළාත් සභා මැතිවරණ නිශ්චිත කාලසටහනකට පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාවට පූර්ණ බලය ලබා දීම
>
> මැතිවරණ සංශෝධන පිළිබඳ දීර්ඝ විස්තරයකට පෙර කාලීන අවශ්‍යතාවයක් ලෙස (1) දැනට වසර දෙකේ සිට හතර දක්වා කාලයකින් ප්‍රමාදවී ඇති පළාත් සභා මැතිවරණ නවය එක වරම වහාම පවත්වමින් එම මැතිවරණ නිශ්චිත කාල සටහනකට එකම දිනයක පැවැත්වීමේ සම්ප්‍රදායකට මුල පිරීමටත් (2) ලබන වසරේ පෙබරවාරි මස වන විට කාලය ඉකුත්වන පළාත් පාලන පද්ධතියේ ක්‍රියාකාරිත්වයට බාධා නොවන ලෙස ඒවායේ නාම යෝජනා කැඳවීමට හා මැතිවරණය පැවැත්වීමේ දින නියම කිරීමටත් අවශ්‍ය පූර්ණ බලතල මැතිවරණ කොමිෂන් සභාවට ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිමු.
>
> යම් හෙයකින් පාර්ලිමේන්තුව විසින් අදාළ අණ පනත් සම්පූර්ණ කර නැති නම් අවසන් වරට අදාළ මැතිවරණය සඳහා යොදාගත් ක්‍රමයවේදයම ඊ ළඟ මැතිවරණයටත් යොදා ගැනීමේ බලතලද මැතිවරණ කොමිෂන් සභාව සතු විය යුතුයි.

අප විසින් මෙම සමාලෝචනයේ ඉදිරිපත් කරන යම් යම් යෝජනාවන් පසු ගිය මැතිවරණවල ප්‍රතිඵල යොදා ගනිමින් තව දුරටත් විශ්ලේෂණයට භාජනය විය යුතු බව අවධාරණය කරන අතර කාරක සභාව විසින්ද අවසාන යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට පෙර පසු ගිය මැතිවරණ ප්‍රතිඵල යොදාගනිමින් එම යෝජනාවන් පූර්ණ විශ්ලේෂණයට භාජනය කළ යුතු බව අපි මතක් කර සිටිමු.

1. <u>සාධනීය දේශපාලන සංස්කෘතියක්</u>: රටේ දේශපාලන සංස්කෘතිය සාධනීය දිශානතියකට ගෙන යාමට මැතිවරණ ක්‍රමය ඉවහල් විය යුතුය. මේ සඳහා මැතිවරණ වියදම් පිළිබඳ සීමා පැනවීම; අපේක්ෂකයන්ගේ අධ්‍යාපනය, වෘත්තීය, වත්කම් බැරකම් විස්තර මෙන්ම හා ඔවුනට එරෙහිව අපරාධ චෝදනා ඇතිනම් ඒවා පිළිබඳ තොරතුරුද අඩංගු ජීව දත්ත අන්තරජාලය හරහා ඡන්ද දායකයින්ට දැන ගැනීමට සැලැස්වීම; හා මැතිවරණ නීති කැඩීම වැළැක්වීම සඳහා අතුරු මැතිවරණ ප්‍රතිපාදන; දේශපාලන පක්ෂ වල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අවම නිර්ණායක හා මහජන නියෝජිතයින් සංඛ්‍යාව දැනට තිබෙන ප්‍රමාණය හෝ අවශ්‍ය අවමයට පවත්වා ගැනීම මැතිවරණ සංශෝධන තුලින් සිදු විය යුතුය.
**2.** <u>ස්වාධීන හා පාරදෘශ්‍ය මැතිවරණ ක්‍රියාවලියක්:</u> මැතිවරණ ක්‍රියාවලියක අත්‍යවශ්‍ය අංග වන සීමා නිර්ණය, මැතිවරණ දින නියම කිරීම - විශේෂයෙන් පළාත් පාලන හා පළාත් සභා මැතිවරණ නිශ්චිත කාල සටහනකට පැවැත්වීම-- සහ නාම යෝජනා බාර ගැනීමේ සිට ප්‍රතිඵල නිකුත් කිරීම දක්වා මුළු මහත් මැතිවරණ පැවැත්වීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම දේශපාලනයෙන් ස්වායත්තව හා පාරදෘශ්‍ය ලෙස මෙහෙයවීම සඳහා අදාළ මැතිවරණ කොමිෂන් සභාව ඇතුළු කොමිෂන් සභා වල ස්වාධීනත්වය ආරක්ෂා වන පරිදි ඒවායේ සියලු පත්වීම් කළ යුතු බව අපි අවධාරණය කරමු.
3. <u>සාධාරණ නියෝජනයක්:</u> දේශපාලන පක්ෂ වලට සමානුපාතික හෝ ආසන්න ලෙස සමානුපාතික නියෝජනයක් ලබා දීමට අමතරව රටේ විසිරී සිටින සුළු ජන කොටස් වල මතවාදයන්ට හෝ අභිලාෂයන්ටද නිසි නියෝජනය ලැබෙන සේ මැතිවරණ ක්‍රමය සැකසිය යුතුයි.
4. <u>පත්වන ආණ්ඩුවට යම් ස්ථාවරත්වයක්</u>: ආණ්ඩුකරණය යන සාධකය හෙවත් තේරී පත්වන ආණ්ඩුවකට රට පාලනය කර ගෙන යාමට අවශ්‍ය අවම බහුතර බලය ලබා දීම යන්න යම් සීමිත බෝනස් ආසන ගණනක් ලබා දීමෙන් සහ/හෝ සම්මුතිවාදී දේශපාලන සංස්කෘතියකින් මිස, සමානුපාතික මැතිවරණ ක්‍රමයේ විකෘති කිරීමකින් හෝ අති බල ජනාධිපතිවරයකු තුලින් සාක්ෂාත් කර ගැනීම සිදු නොවිය යුතු බවද අපි අවධාරණය කරමු.

**සමාකරණ (හෝ simulations) සමඟ පූර්ණ මැතිවරණ ක්‍රම පිළිබඳ විශ්ලේෂණයක අවශ්‍යතාවය**

**2018** පළාත් පාලන මැතිවරණය ශ්‍රී ලංකාවේ මෙන්ම මුළු ආසියාවේම මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමයක් ක්‍රියාත්මක වූ පළමු අවස්ථාවයි. ඒ ගැන නිල වශයෙන් සම්පූර්ණ විග්‍රහයක් සිදු නොවීම ඇත්තෙන්ම කණගාටුදායකය. එවැනි විශ්ලේෂණයකට අවශ්‍ය දත්ත සමුදාය ලබා දීමට අපේ මැතිවරණ කොමිසමට නොහැකි වීමද ගැටලුවකි.

මැතිවරණ ක්‍රමයක් පිළිබඳව අවසාන නිගමනයකට එළැඹීමට පෙර පසුගිය මැතිවරණ ප්‍රතිඵල එම ක්‍රමයට අනුගත වන්නේ කෙසේද යන්න පිළිබඳව පූර්ණ විග්‍රහයක් සියලු පාර්ශවකරුවට ලබා දීම අත්‍යවශ්‍යය

මේ සෑම සාධකයක්ම ප්‍රධාන ලේඛනයේ සවිස්තරව විස්තර කෙරෙනු අතර මැතිවරණ ප්‍රතිසංස්කරණ සාකච්ඡා සඳහා ආරම්භක යෝජනාවලියක් ඉදිරිපත් කරමින් අපි මෙම සමාලෝචනය අවසන් කරමු.

මෙම ආරම්භක යෝජනාවලියේ වෙනත් ප්‍රභේද සාකච්ඡා කළ හැක. කුමක් ප්‍රභේදයක් අනුගමනය කළත් එය සාධාරණ සමාජයක මැතිවරණ සඳහා වූ මූලික අරමුණු වල පිහිටමින් සමානුපාතික ප්‍රතිඵලයක් ලබා දිය යුතු බව අපි අවධාරණය කරමු. ඊට අමතරව මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමයක් යොදා ගන්නේ නම් එම මිශ්‍රණ අනුපාතය 60:40 සේ පවත්වා ගත යුතු බවද අපි කියා සිටිමු. ලෝකය පුරා මිශ්‍ර මන්ත්‍රී සමානුපාතික ක්‍රමය පවතින රටවල් කිහිපය සලකා බලන විට කේවල මට්ටමෙන් පත්වන මන්ත්‍රී ධූර සංඛ්‍යාව සාමාන්‍යයක් ලෙස 60%

උපරිමයක පවත්වා ගන්නේ1 කොට්ඨාසයකට වග කියන මන්ත්‍රීවරුන් පත්කර ගැනීම හා සමානුපාත අවසන් ප්‍රතිඵලයක් ලබා ගැනීම යන අවශ්‍යතා දෙකේ ප්‍රයෝගික තුලනයක් ලෙස බව මෙහි සඳහන් කරමු.

පළාත් පාලන අමාත්‍යංශය මගින් ඉදිරිපත් කර ඇති පළාත් පාලන මැතිවරණ ක්‍රමය සමාලෝචන කමිටු වාර්තාවට අනුව එම මැතිවරණයේදී මන්ත්‍රී ධූර ගණන පෙර තිබූ **4386** සිට **8719** ක් දක්වා වැඩි වීම හා 'දිනන' පක්ෂයට සභාවේ ආසන බහුතරයක් නොලැබීම එම ක්‍රමයේ ප්‍රධාන ප්‍රශ්න ලෙස හඳුන්වා දී ඇත. මන්ත්‍රී ධූර ගණන වැඩිවීම යන්න පැහැදිලි සංසිද්ධියකි. නමුත් කොට්ටාශ මට්ටමෙන් සාමාන්‍යයක් ලෙස **50%** කට අඩු ප්‍රතිශතයකින් ආසන දිනා ගන්නා පක්ෂයක් මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමයක් තුල දිනන පක්ෂය බව එවැනි වැදගත් කමිටුවක් විසින් කියා සිටීම ප්‍රශ්නකාරීය.

**2018** මැතිවරණයේදී සමස්තයක් ලෙස ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ (SLPP) **46.65%** ක් ඡන්ද ලබා ගන්නා විට එක්සත් ජනතා නිදහස් සන්ධානය (UPFA) හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පිළිවෙලින් ඡන්ද 8.94% ක් **4.44%** ලබා ගන්නා ලදී. එම පක්ෂ/සන්ධාන තුන ලැබූ ඡන්ද එකතු කල විට **58.03%** ඡන්ද ප්‍රතිශතයක් ඇත. ඇත්තෙන්ම මේ කණ්ඩායම් තුනම මීට පෙර UPFA ලෙස සන්ධාන ගතව තරඟ කල අයවලුන්ගෙන් සමන්විත නිසා, පොදුජන පෙරමුණට බහුතරයක් ලබා ගැනීමට නොහැකි වීමට හේතුව සමාන දේශපාලන මතවාදයක් තුන් අතකට බෙදීම මිස මැතිවරණ ක්‍රමය නොවන බව පෙනේ. එම කරුණ ජනතාවට පැහැදිලි කිරීම වෙනුවට, කේවල ක්‍රමයට කොට්ඨාස වැඩි ගණනක් දිනූ පමණින් පක්ෂයක් ජයග්‍රහණය කරයි යන ජනතාවගේ දුර්මතය ස්ථිර කිරීම වගකිවයුතු කමිටුවක් මගින් නොකළ යුතු බව අපේ මතයයි.

එම කමිටුව මගින් මෙවැනි සාවද්‍ය හේතු මත පදනම්ව මිශ්‍ර මන්ත්‍රී අනුපාතය 70:30 ට වෙනස් කිරීම හා එල්ලෙන ආසන අනිකුත් පක්ෂ වලින් හිලවු කර ගැනීමෙන් මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමයේ අතිශය විකෘති කිරීමක් සිදුවන බව සඳහන් කරාමු.

පළාත් පාලන ආයතන වල මන්ත්‍රී ධූර ගණන දෙගුණයක් වීම ප්‍රශ්නකාරී බවට මත බේදයක් නැත. නමුත් ප්‍රශ්නයට ආරම්භක හේතුව වන්නේ 2014 සීමා නිර්ණය කමිටුව විසින් පළාත් පාලන කොට්ඨාස ගණන **4919** හා කොට්ඨාස මන්ත්‍රී ධූර **5092** ක් ලෙස නිශ්වය කිරීමයි. මෙයට බොහෝ විට හේතුව එවකට සිටි මන්ත්‍රී වරුන් **4386** ටම හෝ වැඩි ගණනකට ආසනයකට තරඟ කිරීමේ අවස්ථාව ලබා දීම විය හැක. නමුත් එවකට වලංගු **2012** අංක **22** දරන පළාත් පාලන මැතිවරණ පනතට අනුව අමතර මන්ත්‍රී ධූර ගණන කොට්ඨාස මන්ත්‍රී ධූර ගණනින් **30%** ක් පමණක් වූ නිසා මුළු මන්ත්‍රී ගණන **6623** කට සීමා විය.

**2015** දී පත්වූ යහ පාලන රජය විසින් නීති ගත කරන ලද **2016** අංක **1** දරන මැතිවරණ සංශෝධන පනත තුලින් අමතර මන්ත්‍රී ධූර ගණන කොට්ඨාස මන්ත්‍රී ධූර ගණනින් **67%** වන ලෙස හෝ එම අනුපාතය **60:40** වන ලෙස වෙනස් කරමින් පළාත් පාලන මැතිවරණ ක්‍රමය මිශ්‍ර මන්ත්‍රී සමානුපාත ක්‍රමයකට වෙනස් කිරීම ප්‍රගතිශීලී පියවරක් වුවත් එම නිසා මුළු මන්ත්‍රී ධූර ගණන **8334** ක් ලෙස වැඩි විය. ඇත්තටම එම රජය විසින් කළ යුතුව තිබුනේ පළාත් පාලන ආයතන වලට අවශ්‍ය හෝ දැරිය හැකි මන්ත්‍රී ධූර සංඛ්‍යාව පිළිබඳව යම් නිර්ණයක් කර එයින් **60%** ක් වනසේ කොට්ඨාස මන්ත්‍රීධූර ගණන තීරණය කර නව සීමා නිර්ණයක් කිරීමයි. ඒ අවස්ථාවේ සිවිල් සමාජය වුවද එම ඉහළ නැගුනු මන්ත්‍රී ධූර ගණන පිළිබඳව හඬක් නොනැගීමද කණගාටුවට කරුණකි.

**2022** සඳහා නියමිත පළාත් පාලන මැතිවරණයට පෙර නව සීමා නිර්ණයක් කළ හැකිද යන්න සැක සහිතය. නව සීමා නිර්ණයක් ඇතුළු පහත සඳහන් යෝජනා දිර්ඝ කාලීන සංශෝධන සඳහා වේ.

දීර්ඝ කාලීන මැතිවරණ සංශෝධන සඳහා යෝජනාවලියක්

**1.** පළාත් පාලන ආයතන

1 Country (% FPP, Total #seats): Germany (50%, 598); Hungary (53%, 199); Bolivia (54%, 130); New Zealand (58%, 120); Mexico (60%, 500); Lesotho (67%, 120); and Venezuela (68%, 165); Reservations for minorities: Venezuela, 6 and New Zealand, 3. https://aceproject.org/ace-en/topics/es/esd/esd05

1. පළාත් පාලනආයතන සියල්ල සඳහා මැතිවරණයන් වසර හතරකට වරක් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිශ්චිත කරන කාලසටහනකට අනුව එකම දිනක එකට පැවැත්වේ. සෑම මැතිවරණයක් අවසානයේම ඊළඟ මැතිවරණය සඳහා කාල සටහන මැතිවරණ කොමිසම විසින් ප්‍රසිද්ධ කරනු ඇත.
2. පළාත් පාලන ආයතන වර්ග කර ඒවායේ ප්‍රඥප්ති සැකසීම හා සභා වල එක් එක් කමිටු වල කාර්යය භාරය ඇතුළු සභාවක ක්‍රියා පටිපාටි සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය මෙන්ම මන්ත්‍රීවරයකු විසින් වග කිය යුතු ඡන්ද දායකයින් සංඛ්‍යාව හා කොට්ඨාසයක වපසරිය පිළිබඳව අධ්‍යයනයකින් පසු එම එක් එක් පළාත් පාලන ආයතන වර්ගයට අවශ්‍ය මෙන්ම දැරිය හැකි මන්ත්‍රී ධූර සංඛ්‍යාව පිළිබඳව නිර්ණයක් කර එයින් 60% ක් කොට්ඨාස මන්ත්‍රී ධූර ගණන ලෙස තීරණය කළ යුතුය.
3. නව පළාත් පාලන මැතිවරණ කොට්ඨාස සීමා දැනට පවතින කොට්ඨාස 4092 එකතුවක් ලෙස සීමා නිර්ණය කරන්න.[2] එතෙක් දැනට පවතින මන්ත්‍රී ධූර ගණන එසේම පවත්වා ගන්න.
4. මැතිවරණයකින් පසු එල්ලෙන ආසන ඇති වේ නම් ඒවාට කවුන්සිලයේ අමතර ආසන ඇති කෙරේ. (2018 ඡන්දයේදී ලැබූ එල්ලෙන ආසන ගණන 385 කි. එය නියමිත මුළු මන්ත්‍රී ධූර ගණන වන 8334 න් 5% ක් පමණි. මෙය සැලකිය යුතු ගණනක් නොවන බව අපේ මතයයි.)
5. වැඩිම ආසන ගණන ලබාගත් පක්ෂයට බෝනස් ආසනයක් හිමිවේ. අධ්‍යනයකින් පසුව මෙම බෝනස් ආසන ගණන සභාවේ මුළු සභිකයන් ගණනට සමානුපාතික වන අගයක් ලෙස සංශෝධනය කළ හැක.
6. පළාත් පාලන ආයතනයක යම් සුළු ජන කොටසක් උදාහරණ ලෙස 10% ක් හෝ වැඩි ප්‍රතිශතයකට පවතී නම්, හා වැඩිම ආසන ගණනක් ලැබුන පක්ෂයෙන් තේරී පත්වූ හෝ තෝරා පත්කරගත් මන්ත්‍රීන් අතර සුළුජන නියෝජනයක් නැතිනම්, එම පක්ෂයට ලැබෙන බෝනස් ආසනය සුළු ජාතික අපේක්ෂයකුට හිමිවිය යුතුය. එසේ නැතිනම් කාන්තාවකට හිමි විය යුතුය.
7. කාන්තා නියෝජනය: දැනට පරිදිම සියළුම කොට්ඨාස අපේක්ෂකයින්ගෙන් 10% ක් කාන්තාවන් විය යුතු අතර අමතර අපේක්ෂක ලැයිස්තුවෙන් 50% ක් ද කාන්තාවන් විය යුතුය. තුන්වෙනුව, යම් පක්ෂයක පක්ෂ ලැයිස්තුවෙන් තෝරා පත් කරන සෑම මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු කාන්තාවක් විය යුතුය. නමුත් සභාවේ මුළු කාන්තා ප්‍රතිශතය 25% ක් හෝ යම් අගයක් ලෙස නිශ්චිත නොකළ යුතුය.
8. තරුණ නියෝජනය: සෑම පක්ෂයකම මුළු අපේක්ෂකයන් ගණනින් 40% ක් අවුරුදු 35 ට අඩු තරුණ තරුණියන්ගෙන් සමන්විය යුතුය. ජනගහන විද්‍යාඥ ඉන්ද්‍රලාල් ඩි සිල්වා පෙන්වා දෙන අන්දමට 2002-2012 දක්වා කාලය තුල ලංකාවේ උපත් ගණන වැඩි වීම නිසා 2020 සිට තරුණ ජනගහනය වැඩිවෙමින් 2030 වන විට උපරිමයක් පෙන්වනවා ඇත.
9. නාම යෝජනා භාර දීමේදී කාන්තා හා තරුණ කෝටා ප්‍රතිශතයන් ගණනය කර අපේක්ෂක ලැයිස්තුවක අඩු පාඩු පෙන්වා දෙන අන්තර්ජාල මෙවලමක් මැතිවරණ කොමිසම මගින් ස්ථාපනය කල යුතුය. ඊට අමතරව නාම යෝජනා අවසන් වන දිනයට දින තුනකට පෙර නාම යෝජනා වල වැරදි ඇතිනම් ඒවා නිවැරදි කරගැනීමේ අවස්ථාව සෑම දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන ස්වාධීන කණ්ඩායමකට හිමි විය යුතුය.

2. පළාත් සභා

1. පළාත් සභා නමය සඳහා මැතිවරණයන් වසර පහකට වරක් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිශ්චිත කරන කාලසටහනකට අනුව එකම දිනක එකට පැවැත්වේ. සෑම මැතිවරණයක් අවසානයේම ඊළඟ මැතිවරණය සඳහා කාල සටහන මැතිවරණ කොමිසම විසින් ප්‍රසිද්ධ කරනු ඇත.

2. දැනට පවතින මුළු මන්ත්‍රීන් ගණන වන 437 හි වෙනසක් නැත. කොට්ඨාස 262 කින් එක් ආසනයට එක් මන්ත්‍රී වරයෙක් ලෙස මන්ත්‍රීවරුන් 262 ක් ද, තවත් 175 ක් ලැයිස්තු වලින්ද ලෙස මන්ත්‍රී වරුන් 437 ක් 60:40 අනුපාතයට හා 262+175=437 වන සේ මන්ත්‍රීවරුන් 447 තෝරා ගැනේ.
3. පළාත් පාලනආයතන 1-3 ක එකතුවක් ලෙස කොට්ඨාස 262 සීමා නිර්ණය කළ යුතුයි.

---

2 මෙවැනි සීමා නිර්ණයන් සඳහා ඩිජිටල් ඇල්ගොරිතම භාවිතා කරන ආකාරය පිළිබඳව ලාංකික මෘදුකාංග විද්‍යාඥයෙක් වන නුවන් සේනාරත්න විසින් විසින් කරුණු පෙන්වා දී ඇත. https://medium.com/on-politics/5-properties-of-good-electoral-maps-b64bced5cf2e

4. වැඩිම ආසන ගණන ලබාගත් පක්ෂයට බෝනස් ආසන දෙකක් හිමිවේ. අධ්‍යනයකින් පසුව මෙම බෝනස් ආසන ගණන සභාවේ මුළු සභිකයන් ගණනට සමානුපාතික වන අගයක් ලෙස සංශෝධනය කල හැක.

5. පළාත් පාලන ආයතන සඳහා යෝජිත - එල්ලෙන ආසන (1.5), සුළුජන නියෝජනය (1.6), කාන්තා නියෝජනය (1.7), හා නම්‍යශීලී නාම යෝජනා ක්‍රියාවලියක් පිළිබඳ ප්‍රතිපාදන (1.9) ඇතුළු -- ප්‍රතිපාදන පළාත් සභා වලටද එලෙසම බල පායි. තරුණ නියෝජන ප්‍රතිපාදන (1.8) පළාත් සභා වලට අදාළ නොවේ.

## 3. පාර්ලිමේන්තුව

1. ව්‍යවස්ථානුකූලව නියමිත කාලයට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හරින අවස්ථාවල හැරුණු විට මැතිවරණ කොමිෂන් සභාව විසින් පල කරනු ලබන කාල සටහනකට අනුව වසර පහකට වරක් මැතිවරණ පැවැත්වේ,

2. දැනට පරිදිම මුළු මන්ත්‍රීවරුන් ගණන 225 ට පවත්වා ගැනේ. පළාත් සභා කොට්ඨාස වල එකතුවක් ලෙස සැදුනු පාර්ලිමේන්තු කොට්ඨාස 140 කින් එක් මන්ත්‍රී වරයෙක්ද තවත් 85 ක් අමතර අපේක්ෂක ලැයිස්තු වලින්ද ලෙස 60;40 අනුපාතයට මන්ත්‍රීවරුන් 225 තෝරා පත් කර ගැනේ.

3. ජයග්‍රාහී පක්ෂයට බෝනස් ආසන පහක් ලැබේ. තවත් ආසන පහක් යම් කාල සීමාවකට යටත්ව අවතැන් වූවන් ඇතුළු වෙනත් විශේෂ නියෝජනයන් සඳහා වෙන් කෙරේ. තවත් ආසන 29 ක් ජාතික ලැයිස්තු මන්ත්‍රීධූර හෝ එල්ලෙන ආසන සඳහා වෙන් කෙරේ.

4. ඉතිරි මන්ත්‍රී ධූර 186 ජාතික මට්ටමෙන් 0-5% දක්වා කඩ ඉමක් යොදා ගනිමින් සමානුපාතික ලෙස පක්ෂ අතර බෙදේ. ඉන් ආසන 140 කට කොට්ඨාස මට්ටමෙන් දිනූ මන්ත්‍රී වරුන් තෝරා පත් කර ගැනේ. ඉතිරි අමතර මන්ත්‍රී ධූර 46 එක් එක් පක්ෂයට එක් එක් දිස්ත්‍රික්ක වලින් ලැබුණු ඡන්ද ප්‍රමාණයට සමානුපාතිකව දිස්ත්‍රික්ක අතර බෙදේ. අවසානයේ දිස්ත්‍රික්කයකට ලැබෙන ලැයිස්තු ආසන ගණන නිශ්චිත අගයක් නොවේ.

(මෙම ක්‍රමයේ වෙනත් ප්‍රභේද, උදාහරණ ලෙස පළාත් මට්ටමෙන් සමානුපාතය ගණන් කිරීම, වැනි ක්‍රම වේදද හැදෑරිය යුතු බව අපි යෝජනා කරමු).

5. පළාත් පාලන ආයතන සඳහා යෝජිත - එල්ලෙන ආසන (1.5), සුළුජන නියෝජනය (1.6), කාන්තා නියෝජනය (1.7), හා නම්‍යශීලී නාම යෝජනා ක්‍රියාවලියක් පිළිබඳ ප්‍රතිපාදන (1.9) ඇතුළු -- ප්‍රතිපාදන පළාත් සභා වලටද එලෙසම බල පායි. තරුණ නියෝජන ප්‍රතිපාදන (1.8) පළාත් සභා වලට අදාළ නොවේ.

## 6. ආරම්භක මැතිවරණ යෝජනාවලියක්

මෙම යෝජනාවලියේ සඳහන් පිරිවිතර සාකච්ඡා සඳහා පමණක් ආරම්භක කරුණු වේ. උදාහරණයක් වශයෙන් පාර්ලිමේන්තුව ආසන 225න් ආසන 39 ක් --බෝනස් ආසන 5ක්, අවතැන් වූවන් සඳහා ආසන 5ක් හා ජාතික ලැයිස්තු ආසන 29 ක් -- ලෙස වෙන් කර ඉතිරි ආසන 186 ජාතික මට්ටමින් කඩ ඉම් සීමාවක් නොමැතිව බෙදීම තුලින් කුඩා පක්ෂ නියෝජනය උපරිම වන නමුත් පාර්ලිමේන්තු ආසන පක්ෂ ගණනාවක් අතර බෙදීමෙන් එක් පක්ෂයකට හෝ සන්ධානයකට ආණ්ඩුවක් පිහිටුවිය නොහැකි වනු ඇත. දෙවනුව ආසන 186ක් දිස්ත්‍රික්ක මට්ටමින් 5% ක කඩ ඉම් සීමාවට යටත්ව බෙදීමෙන් දැනට දිස්ත්‍රික්ක මට්ටමෙන් පත්ව එන කුඩා පක්ෂ වලට අසාධාරණයක් සිදුවේ. නියෝජනය සහ ස්ථාවරත්වය අතර නිවැරදි සමබරතාවය තෝරා ගැනීම දේශපාලනික තීන්දුවක් වන නමුත් එම තීරණයට එළඹීම සඳහා අවශ්‍ය පසුගිය මැතිවරණ ප්‍රතිඵල යොදා කෙරෙන සමාකරණ අධ්‍යනයන් (හෝ simulations) සහිත පූර්ණ විශ්ලේෂණයක් සහිතව හා පාරදෘශ්‍ය ලෙස එම තීන්දු ගැනීම සිදු විය යුතුය.

| | පළාත් පාලන ආයතන | | පළාත් සභා | | පාර්ලිමේන්තුව |
|---|---|---|---|---|---|
| | පවතින ක්‍රමය, 2022 සඳහා පමණි | නව සීමා නිර්ණ අවශ්‍යය නව ක්‍රමයක්, 2022 න් ඔබ්බට | පවතින ක්‍රමය, 2022 සඳහා පමණි | නව සීමා නිර්ණ අවශ්‍යය නව ක්‍රමයක්, 2022 න් ඔබ්බට | නව සීමා නිර්ණ අවශ්‍යය නව ක්‍රමයක්, 2022 න් ඔබ්බට |
| ආයතන ගණන | 347 | 347 | 9 | 9 | 1 |
| මැතිවරණ ක්‍රමය | මිශ්‍ර මන්ත්‍රී සමානුපාත-MMP | මිශ්‍ර මන්ත්‍රී සමානුපාත-MMP | PR + මනාප ඡන්ද | මිශ්‍ර මන්ත්‍රී සමානුපාත-MMP | මිශ්‍ර මන්ත්‍රී සමානුපාත-MMP |
| මුළු මන්ත්‍රී ධූර/ආසන සංඛ්‍යාව | 8334 | ~6000 | 437 | 437 | 225 |
| කොට්ඨාස මන්ත්‍රී ධූර/ආසන | 5092 | ~3600 | - | 262 | |
| ඌන පූරණ මන්ත්‍රී ධූර/ආසන3 | 3242 | ~2,400 | - | 175 | 85 |
| කේවල: ඌන පූරණ අනුපාතය | 60:40 | 60:40 | - | 60:40 | 60:40 |
| සීමා නිර්ණය | නව සීමා නිර්ණයක් අවශ්‍ය නැත. එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සැලකේ. | දැනට පවතින පළාත් පාලන කොට්ඨාස (Wards) ගණනේ එකතුවක් ලෙස හා එසේ පමණක් ලෙසම 4919 වූ කොට්ඨාස ගණන 3000 ට හෝ ආසන්න ගණනකට අඩු කරන්න. | නව සීමා නිර්ණයක් අවශ්‍ය නැත. එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සැලකේ. | පළාත් පාලන ආයතන හෝ ප්‍රදේශීය්ස ලේකම් කොට්ඨාස වල එකතුවක් ලෙස හා එසේ පමණක් ලෙසම පළාත් කොට්ඨාස 262ක් හෝ ආසන්න ගනනක් නිර්ණය කරන්න. | පළාත් කොට්ඨාස වල එකතුවක් ලෙස හා එසේ පමණක් වන ලෙස පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාස 140 ක් නිර්ණය කරන්න.4 |
| නාම යෝජනා විධි විධාන | නාම යෝජනාවත් සමගම අපේක්ෂකයින්ගේ වත්කම් බැරකම් හා අපරාධ චෝදනා ඇතිනම් ඒවා පිළිබඳ තොරතුරු අඩංගු ජීව දත්ත අන්තර් ජාලය හරහා ඡන්ද දායකයින්ට දැන ගැනීමට සැලැස්වීම; ලැයිස්තු වලින් ඉදිරිපත් වෙන අපේක්ෂයින් විසින් තමන් තෝරා ගත් ක්ෂේත්‍රයක හෝ වැඩි ගණනක තමන්ගේ ප්‍රවීනත්වය පිළබඳව වචන 100 කට නොවැඩි ප්‍රකාශනයක්ද නාම යෝජනා සමග භාර දීම අනිවාර්ය කෙරේ. | | | | |
| ඇපය රාජ සන්තක වීමේ කඩ ඉම | එක් එක් මැතිවරණ තලය සඳහා සුදුසු ඇපය හා ඇපය රාජ සන්තක වීමේ කඩ ඉම පසු ගිය මැතිවරණ වල අත් දැකීම් විශේෂයෙන්ම 2018 පළාත් පාලන මැතිවරණයේදී මන්ත්‍රීවරයෙකු තෝරා යැවීමට හැකි වූ පක්ෂ වලට සමස්ථයක් ලෙස 5% ක් ඡන්ද නොලැබූ නිසා ඇපය රාජ සන්තක වීම වැනි තත්වයන් සලකා බැලිය යුතුය. . | | | | |
| ද්විත්ව ඡන්ද පත්‍රිකා | ලංකාවේ MMP මැතිවරණ වලට ද්විත්ව ඡන්ද පත්‍රිකා යොදා නොගැනෙන ලෙස යෝජනා කරන්නේ tactical voting යන සංසිද්ධිය වැළැක්වීමටය. | | | | |
| බෝනස් ආසන | 1 | | 2 | | 5 |
| උතුරු නැගෙනහිර ජනතාවගේ නියෝජනය | ජන වාර්ගික අර්බුදය නිසා අවතැන් වූ උතුර-නැගෙනහිර ජනතාව සඳහා උතුරු\ පලාතට නිශ්චිත කාල සීමාවක් සඳහා අමතර අමතර පාර්ලිමේන්තු ආසන ගණනක් මෙන්ම විසිරී සිටින ජන කොට්ඨාස වල නියෝජනය සඳහා ආසාන් පහක් වෙන් කෙරේ. | | | | |
| සමානුපාත ගණනය සඳහා ඒකකය | එක් එක් පළාත් පාලන ආයතනය | | එක් එක් පළාත | | ශ්‍රී ලංකාව |
| සමානුපාතිකව බෙදෙන ගණන | පළාත් පාලන ආයතනයක මුළු ගණනින් බෝනස් ආසන අඩු කර | | පළාත් සභාවක ආසන මුළු ගණනින් බෝනස් ආසන අඩු කර | | 225-5-5-29 = 186 |

3 ඌන පූරණ ආසන (Compensatory seats) යනු සමස්ත ප්‍රතිඵලය සමානුපාත ප්‍රතිඵලයක් කිරීම සඳහා පක්ෂ වලට ලබා දෙන අමතර මන්ත්‍රී ධූර සංඛ්‍යාවයි

4 පළමුව ආසන 36ක් ව්‍යවස්ථාවේ 96 වැනි වගන්තියට අනුව පළාත් නමයට බෙදා ඉතිරි ආසන 104 ඉහලම ශේෂ ක්‍රමයට එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කයේ ජන්ගණනය සමානුපාතිකව බෙදිය හැක.

| | | | | | |
|---|---|---|---|---|---|
| සමානුපාත ගණනයට කඩ ඉම | 0% | TBD (තීරණය කළ යුතුව ඇත) | 0% | TBD | TBD (0.0-5.0%) |
| සුළු මතවාද නියෝජනය | එල්ලෙන ආසන සංසිද්ධිය නිසා අවසාන ප්‍රතිඵලය සමානුපාතයෙන් බැහැර වීම වැළැක්වීමට කේවල ක්‍රමයට තේරී පත්වන මන්ත්‍රීන් ප්‍රතිශතය 60% කට නොවැඩි වන ලෙස පවත්වා ගනු ඇත.simulations යොදා ගනිමින් දැනට පවතින නියෝජනය ආසන්න වශයෙන් පවත්වා ගැනීමට කටයුතු කරුණු ඇත. | | | | |
| විසිරී සිටින සුළු ජන කොටස් නියෝජනය | පළාත් පාලන ප්‍රදේශයක, පලාතක හෝ රටේ යම් ජන කොට්ඨාශයක් 10% හෝ යම් තීරණය කෙරෙන ප්‍රතිශතයකින් පැවතේ නම් හා විසිරී පැවතී සිටීම නිසා ඔවුනට සාධාරණ නියෝජනයක් හිමි නොවේ නම් දිනන පක්ෂයේ බෝනස් ආසන වලින් එකක් එම ජන කොට්ඨාසයට හිමිවේ. | | | | |
| කාන්තා නියෝජනය | සියළු කොට්ඨාස අපේක්ෂකයින්ගෙන් 10%ක් හා සියලු ලැයිස්තු මන්ත්‍රී ධූර වලින් 50% ක් කාන්තාවන්ට වෙන් විය යුතුය. ලැයිස්තු වලින් මන්ත්‍රීන් තෝරා පත් කර යවන විට සෑම පත්කිරීම් දෙකකට එකක් කාන්තාවක් විය යුතුය. පාර්ලිමේන්තුව සඳහා මේ විධි විධානය බලපාන්නේ ජාතික ලැයිස්තුවට පමණි. | | | | |
| තරුණ නියෝජනය | පළාත් පාලනයට පමණක් සියළු අපෙක්ෂකයින්ගෙන් 40% ක් අවුරුද 35 ට අඩු තරුණයන් විය යුතුය. | | | | |

වැඩි විස්තර සඳහා

ආචාර්ය සුජාතා ගමගේ

**077-774-8470** හෝ 011 2 512 992; gamage@gmail.com

සාධාරණ සමාජයක් සඳහා වන ව්‍යාපාරය

අංක 8/32ඒ, ශ්‍රී සිද්ධාර්ථ මාවත, කිරුලපන